<u>ඇමෙරිකානු එක්සත් ජනපද තානාපති කාර්යාලය විසින් සම්මුඛ පරීක්ෂණ අත්හැරීමේ වැඩසටහන දියත් කෙරේ.</u>

2016, අප්‍රේල් මස 11: කොළඹ ඇමෙරිකානු තානාපති කාර්යාලය විසින් අද දින සුදුසුකම්ඇති වීසා බලපත්‍ර අයදුම් කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණ අත්හැරීමේ වැඩසටහන දියත් කෙරින. මෙම වැඩ සටහන මගින් සදුසුකම් ඇති අයදුම් කරුවන් විසින් ඔවුන්ගේ වීසා බලපත්‍ර නැවත අලුත් කිරීම සඳ හා පුද්ගලික සම්මුඛ පරීක්ෂණයකට පෙනි නොසිට එය ලබාගැනීමට අවස්ථාව සලසා දෙයි.
මෙම වැඩසටහන යොදා ගත හැක්කේ මීට පෙර ඇමෙරිකානු එක්සත් ජනපදයට ගමන් කර ඇති සහ අප්‍රේල් 2008 න් පසු නිකුත් කර ඇති **B1/B2** සංචාරක වීසා බලපත්‍ර අලුත් කිරිමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් විසින් පමණි. මුල්වරට අයදුම් කරන අයට මෙම වැඩසටහන සඳහා සුදුසුකම් නොලබයි. ඇමෙරිකානු තානාපති කාර්යාලය විසින් අයැදුම්පත්‍ර භාරගනු ලබන්නේ මෙ ම කොන්සියුලර් දිස්ත්‍රික්කයේ පදිංචි ශ්‍රී ලාංකිකයන් සහ මාලදිවයින ජාතිකයන් ගෙන් පමණි.

"මෙම වැඩසටහන මගින් වීසා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය අනුකූලන කරන අතර ශ්‍රී ලාංකික සහ මාලදිවයින ජාතික වීසා බලපත්‍ර අයදුම්කරුවන් වෙත පරිභෝගික සේවය වැඩි දියුණු කෙරෙයි" යනුවෙන් ඇමෙරිකානු තානාපති අතුල් කෙෂප් තුමා පවසයි. "මෙම වැඩසටහන මගින් ඇමෙරිකා එක්සත් ජනපදයට ගමන් කිරීම වඩා පහසු කෙරෙයි."

**DS 160** මාර්ගගත අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීම සහ සාමාන්‍ය පැසුරුම් ගාස්තුව ගෙවීම කළ පසුව සියළු වීසා බලපත්‍ර අයදුම් කරුවන් මෙම වැඩසටහන සඳහා සළකා බැලීමට නිරාසයෙන්ම භාජනය වේ. මෙම වැඩසටහන සඳහා සුදුසුකම් ලැබීම සඳහා පෙර-ගමන් ඉතිහාසය බලපානු ලැබේ. මෙම වැඩසටහන සඳහා සුදුසුකම් නොලබන අයදුම් කරුවන් වෙත සාමාන්‍ය වීසා පරීක්ෂණයක් සඳහා පරිගණක පද්ධතිය මගින් යොමු කිරීමක් සිදු කෙරෙයි.

හුදෙක් මෙම වැඩසටහන සඳහා සුදුසුකම් ලැබීම, වීසා බලපත්‍ර සඳහා සුදුසුකමක් ලෙස සැලකිය නොහැක. අනුමත කෙරුණු අයදුම් පත්‍ර වලට අදාල වීසා බලපත්‍ර, ලිය කියැවිලි මෙම තනාපති කාර්යාලයට භාරදී දින දෙකකින් අනතුරුව ලබා ගත හැක. දැනට සම්මුඛ පරීක්ෂණ සඳහා වේලාවන් ලබා ගෙන තිබෙන අයදුම් කරුවන්ට මෙම වැඩසටහනට සුදුසුකම් නොලබයි.
මෙම වැඩසටහන පිළිබඳ වැඩි විස්තර සඳහා තානාපති වෙබ් අඩවිය වන srilanka.usembassy.gov වෙත පිවිසෙන්න.